# දරුවන් උදෙසා බයිබලයක්



# හාස්කමේ මිනිසා, එලිෂා

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Lazarus
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

නගුල අදින්නට ප්‍රමාණවත් ගවයන් නොසිටියේය. නව එකෙක් අවශ්‍යවී තිබුණි. නමුත් ඒ ප්‍රශ්නයට, එලිෂා නම් තරුණ ගොවියාව නවත්වන්න නොහැකි විය. ඔහු අඩුවූ ගවයාගේ තැන ලබා ගනිමින් ගවයන් සමග එකතු වූයේය. ඔහු ශක්තිමත්, දක්ෂ, වෙහෙස මහන්සි වී වැඩ කරන මිනිසෙකු වූවා විය යුතුය.





එලිෂා සීසාමින් සිටින විට
දෙවියන් වහන්සේගේ
අය්ගතවක්තෘ වූ එළියා ඔහු
ළගට පැමිණ ඔහුට කතා කළේය.
තරුණයා දෙවියන් වහන්සේගේ
සේවකයෙකු වීමට තම ගොවිපල
අත්හැර ගියේය. දිනක් දෙවියන්
වහන්සේ එළියාව සුළි සුළඟකින්
ස්වර්ගයට කැඳවා ගත් සේක.
ඉන්පසු එලිෂා ඊශ්‍රායෙල්වරුන්ට
දෙවියන්
වහන්සේගේ
අනාගතවක්තෘවරයා
වූයේය.



එළියා නික්මගිය නිසා එලිෂා දුක් වූ නමුත්, ඔහු දෙවියන් වහන්සේට එළියා තුළ තිබුණ මෙන් බලය තමුන්ටත් ලබා දෙන ලෙස යාච්ඤා කළේය. එලිෂා එළියාගේ සළුව ගෙන, එළියා කළාක් මෙන් ගඟේ ගලා යන ජලයට පහර දුන්නේය. ජලය බෙදී ගියේය!

දෙවියන් වහන්සේ තමා සමඟ සිටින බව එලිෂා ඉන් දැන ගත්තේය.



එලිෂා බෙතෙල් නම් නගරයට යන කල්හි සමහර තරුණයෝ ඔහුට සමච්චල් කරමින්, “පලා යව තට්ටයා” කියා කෑ ගැසුවෝය. එලිෂා දෙවියන් වහන්සේගේ සේවකයෙකු බව ඔවුහු නොතැකුවෝය. ඔවුන් කම්පනයට පත් කළ දෙයක් සිදු විය. වැළහින්නියන් දෙදෙනෙක් වනාන්තරයෙන් පිටතට පැමිණ තරුණයින් හතළිස් දෙදෙනෙකු මරා දැමුවෝය.

දිනක් එලිෂාට වැන්දඹුවක් හමු විය. ඇය ණයට ගත් මුදලක් නැවත ගෙවා ගත නොහැකිව සිටියාය. ඇයගේ ණය හිමියා තම මුදල් නැවත ලබා ගැනීම සඳහා වැන්දඹුවගේ පුතුන් දෙදෙනා වහලුන් ලෙස රැගෙන යාමට සූදානමින් සිටියේය. “යන්න, ඔබගේ සියලු අසල්වැසියන්ගෙන් හිස් භාජන ඉල්ලා ගන්නයැ”යි එලිෂා ඇයට කීවේය. ඒ කාන්තාව වෙනුවෙන් දෙවියන් වහන්සේ ආශ්චර්යයමත් දෙයක් කරන්නට සූදානමින් සිටිසේක.



වැන්දඹුවගේ නිවසේ තිබුණේ
කුඩා තෙල් තුළාවක් පමණි.
නමුත් එම කුඩා භාජනයෙන් ඇය
එම හිස් භාජන සියල්ල පිරවීමට
තරම් තෙල් වත් කළාය! ඒ
දවස්වල ඔවුන්ට නාන තටාක
තිබුණා නම්, දෙවියන් වහන්සේ
ඒවාද පුරවනු ඇත. වැන්දඹුව
තෙල් විකුණා තම පුතුන්
බේරාගත්තාය.



තවත් කාන්තාවක් සහ ඇගේ
ස්වාමිපුරුෂයා ඔවුන්ගේ නිවසෙහි විශේෂ
කාමරයක් එලිෂා වෙනුවෙන් සෑදුවෝය.
ඔහුට ඒ ප්‍රදේශය හරහා
යන විට එහි වාසය කිරීමට
හැකි විය. කාමරයේ
ඇඳක්, මේසයක්,
පුටුවක් සහ
පහන් රුකක්
තබා තිබුණි.
ඒ කාමරය
නිතරම එලිෂාට
වෙන් කර තිබුණි.



මෙම යුවළ දක්වන කරුණාව වෙනුවෙන් ඔවුන්ට කළගුණ සළකන්නේ කෙසේදැයි එලිෂා කල්පනා කළේය. ඔවුන්ට දරුවන් නොමැති බව ඔහු දැනගත් විට, ඔහු ඒ කාන්තාවට විශ්වාස කළ නොහැකි දෙයක් කීවේය. “ලබන වසරේ මේ වෙලාව වනවිට ඔබ පුතෙකු වැළඳ ගනිමින් සිටිනු ඇත.”
වසරකට පසුව, දරුවා
උපත ලැබීය.



වසර කිහිපයකට පසු එම දරුවාම තම පියා සමඟ කෙතේ සිටියේය. “මගේ ඔළුව, මගේ ඔළුව” කියමින් දරුවා කෑගැසුවේය. ඔවුන් පිරිමි ළමයා ඔහුගේ මව වෙත ගෙන ආ විට, ඔහු දහවල් වනතුරු ඇයගේ දණහිස් මත වාඩිවී හිඳ, පසුව මිය ගියේය. මව එලිෂාගේ කාමරයේ ඇඳ මත දරුවාගේ සිරුර තැබුවාය. ඔබ සිතන පරිදි ඇයට උදව් කළ හැක්කේ කාටද?



ඔබ කීවේ එලිෂා කියාද? එය නිවැරදිය! ඇය කොටළුවෙකු පිට සැදලයක් දමා වේගයෙන් ඔහු සොයා ගියාය. එලිෂා ඇගේ නිවසට පැමිණ, තනිවම උඩුමහලට ගොස් ස්වාමින් වහන්සේට යාච්ඤා කළේය. දෙවියන් වහන්සේ දරුවාව නැවත ජීවත් කළ සේක. එලිෂා කාන්තාව අමතා, “ඔබේ පුතාව ගන්නයැ”යි කීවේය. ඇය කොතරම් සතුටු වන්න ඇද්ද?





අසල පිහිටි සිරියාව නම්
දේශයේ නාමන් නම්වූ
සේනාධිපති වරයෙක්
වාසය කළේය. ඔහු
නිර්භීත හා ශක්තිමත්
කෙනෙකු වූයේය. නමුත්
ඔහුට ලාදුරු නම් දරුණු
සමේ රෝගයක් තිබුණි.

නාමන්ගේ බිරිඳට
ඊශ්‍රායලයෙන් අල්ලා ගත්
කුඩා වහලියක් සිටියාය.
මේ කුඩා දැරිය, “නාමන්
ඉශ්‍රායෙල්හි සිටින
අනාගතවක්තෘ සමඟ
සිටියා නම්, ඔහු ඔහුගේ
ලාදුරු රෝගය සුව
කරනවා ඇතැ”යි
පැවසුවාය.



නාමන්, අනාගතවක්තෘවරයා මුණ ගැසීමට එකවරම පිටත් වූයේය. ඔහු රිදී, රන් හා අලංකාර ඇඳුම් තෑගි ලෙස ගෙන ගියේය.





එලිෂාගේ සේවකයා
නික්ම විත්, “ගොස්
යොර්දාන් ගඟේ සත්
වරක් සෝදා පවිත්‍ර
වන්නයැ”යි කීය.
නාමන් කෝප වූයේය.
ඔහුගේම භූමිය වන
සිරියාවේ පිරිසිඳු,
නැවුම් ගංගාවලින්
සෝදා ගැනීමට ඔහුට
නොහැකිද?
කෝපයෙන් ඔහු හැරී
නිවස දෙසට ගියේය.



නාමන්ගේ වාසනාවට
ඔහුගේ සේවකයෝ
එලිෂාගේ අණට කීකරු
වන මෙන් ඔහුට කීවෝය.
එබැවින් නාමන් යෝර්දාන්
ගඟේ සත් වරක් ගිලී
නැවේය. ලාදුරු රෝගියෙකු
ව සිටි නාමන් සුව වූයේය!
ඉන්පසු නාමන් නමස්කාර
කළේ සැබෑ දෙවියන්
වහන්සේටය. එනම්
එලිෂාගේ දෙවියන්
වහන්සේ වූ, ඔහුව ලාදුරු
රෝගයෙන් සුව කළ
ස්වාමින් වහන්සේටය.



දෙවියන් වහන්සේ ඔහුගේ සේවකයා වූ එලිෂාව මිය ගිය පසු පවා උන්වහන්සේගේ ආශ්චර්යයමත් ක්රියා සඳහා යොදාගත් සේක. දිනක් බොහෝ කලකට පෙර එලිෂාව තැන්පත් කර තිබූ ගුහාවේ මළ සිරුරක් තැන්පත් කරන ලද්දේය. ඒ මළ සිරුර මත අනාගතවක්තෘවරයාගේ ඇටකටු ස්පර්ශ වූ විට, මිනිසා නැවත පණ ගැන්වී සිටගත්තේය. සැබවින්ම, දෙවියන් වහන්සේ තම විශ්වාසවන්ත සේවකයා වූ එලිෂා මාර්ගයෙන් උන්වහන්සේගේ මහත් බලය පෙන්වූ සේක.

හාස්කමේ මිනිසා, එලිෂා

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

2 රාජාවලිය 2-13

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය 119:130**

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)